සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** 63 - ව්‍යවසායකත්ව අධ්‍යයනය I (නව නිර්දේශය) **කාලය පැය 1 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

01 ව්‍යවසායකයා යනු,
(i) නිෂ්පාදන සාධක මෙහෙයවීමේ නිරතවන්නා ය.
(ii) ව්‍යාපාර ක්‍රියාවලියේ යෙදී සිටින්නා ය.
(iii) ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ යෙදී සිටින්නා ය.
(iv) වැටුපට කායික හා මානසික ශ්‍රමය සපයන්නා ය.

02 නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍රයක් වන්නේ,
(i) අනපේක්ෂිත සිදුවීමක්, (ii) අනුකරණය කිරීමක්,
(iii) නව සොයාගැනීමක්, (iv) සංකලණයක්,

03 ව්‍යවසායකයෙකුට තම නිර්මාණශීලීත්වය වර්ධනය කර ගත හැකි ක්‍රමයක් නොවන්නේ,
(i) අසාර්ථකත්වය ඉවසීම ය. (ii) කුතුහලය දිරිමත් කිරීම ය.
(iii) ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීමය. (iv) නිර්මාණාත්මක හැසිරීම් ආදේශනය කිරීමය.

04 ලාභ අපේක්ෂාවෙන් ව්‍යාපාර කටයුතුවල නිරතවන ව්‍යවසායකයෝ හඳුන්වනු ලබන්නේ,
(i) ආයතනික ව්‍යවසායකයෝ ලෙස ය. (ii) ව්‍යාපාර ව්‍යවසායකයෝ ලෙසය.
(iii) සමාජීය ව්‍යවසායකයෝ ලෙසය. (iv) අභ්‍යන්තර ව්‍යවසායකයෝ ලෙසය.

05 මිනිසාට අනිවාර්යයෙන් ම සපුරාගත යුතු අවශ්‍යතා පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,
(i) බත්, ජලය, වාතය (ii) අධ්‍යාපනය, බත්, ජලය
(iii) සෞඛ්‍ය, අධ්‍යාපනය, පොත් පත් (iv) ප්‍රවාහනය, ආහාර, ආරක්ෂාව

06 භාණ්ඩ හා සේවා යනු මිනිස් අවශ්‍යතා සපුරාලන ඕනෑම දෙයකි. මේ අනුව මිනිස් අවශ්‍යතා සපුරාලන සේවාවක ලක්ෂණයක් වන්නේ,
(i) අස්පෘශ්‍ය වීම. (ii) ගබඩා කළ හැකි වීම.
(iii) සපයන්නාගෙන් වෙන් කළ හැකි වීම. (iv) සමජාතීය බව අපේක්ෂා කළහැකි වීම.

07 ව්‍යවසායකයෙක් අයිතිකරුගේ භූමිකාවේ කටයුතු කිරීමේදී ඉටුකිරීමට සිදුවන කාර්යයක් වන්නේ,
(i) සේවකයන් මෙහෙයවීම. (ii) සේවකයන්ට බලපෑම් කිරීම.
(iii) අවදානම් දැරීම. (iv) ව්‍යාපාරයේ සැලසුම් සකස් කිම.

08 නූතන ව්‍යාපාර පරිසරය තුල දැකිය නොහැකි ලක්ෂණයක් වන්නේ,
(i) තරඟකාරීත්වය වැඩි වීම. (ii) ව්‍යාපාරිකයා බලවත් වීම.
(iii) පාරිභෝගිකයා බලවත් වීම. (iv) ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම.

09 ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් සාධක පමණක් ඇතුලත් පිළිතුර වනුයේ,

(i) සම්පත්, සේවකයන්, ප්‍රජාව, තාක්‍ෂණය.

(ii) ප්‍රජාව, සමාජ හා සංස්කෘතිය, තාක්‍ෂණය, සම්පත්.

(iii) කළමනාකරුවන්, සේවකයන්, සම්පත්, අයිතිකරුවන්.

(iv) සම්පත්, අයිතිකරුවන්, ප්‍රජාව, සමාජ සංස්කෘතිය.

10 ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශ තුන වන්නේ,

(i) ප්‍රාථමික, ද්විතියික, තෘතියික. (ii) ප්‍රාථමික, නිමැවුම්, ඉදිකිරීම්.

(iii) ඉදිකිරීම්, වෙළඳාම, නිමැවුම්. (iv) ධීවර, ඉදිකිරීම්, වෙළඳාම.

11 යම් පුද්ගලයෙකු ගේ නව සොයාගැනීමක් වෙනුවෙන් ලබා ගන්නා පේටන්ට් බලපත්‍රයක වලංගු කාලය නම්,

(i) අවුරුදු 7 කි. (ii) අවුරුදු 20 කි. (iii) අවුරුදු 15 කි. (iv) අවුරුදු 10 කි.

12 සෑම ව්‍යාපාර අදහසක් ම ව්‍යාපාර අවස්ථාවක් නොවේ. ඒ අනුව ව්‍යාපාර අවස්ථාවක ලක්‍ෂණයක් වන්නේ,

(i) සුලභ වීම. (ii) විවෘත වීම.

(iii) ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි වීම. (iv) අනාවරණය කර ගැනීම අසීරු වීම.

13 නව ව්‍යාපාරයක් සඳහා යෝග්‍ය පිවිසුම් මාර්ගයක් නොවන්නේ,

(i) නිෂ්පාදන ප්‍රභේදනය (ii) අනුකරණය

(iii) නවෝත්පාදනය (iv) වෙළඳපොළ හිඩැස

14 ඕනෑම කාර්යයක් සාර්ථක කර ගැනීමට අවශ්‍ය වන්නේ,

(i) දැක්මක් ය. (ii) අරමුණක් ය. (iii) සැලැස්මක් ය. (iv) ක්‍රියාකාරකම් ය.

15 අභ්‍යාස පොත් සඳහා ඉලක්කගත පාරිභෝගික කොට්ඨාසයක් නොවන්නේ,

(i) ලේඛකයන් ය. (ii) පාසල් සිසුන් ය. (iii) ගෘහනියන් ය. (iv) පෙරපාසල් සිසුන් ය.

16 බටර් සඳහා ආදේශණ භාණ්ඩයක් වන්නේ,

(i) මාගරින් ය. (ii) පොල්තෙල් ය. (iii) එළවළු තෙල් ය. (iv) චීස් ය.

17 ව්‍යාපාරයක අලෙවිකරණ උපාය මාර්ග පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

(i) නිෂ්පාදිතය, මිල, ස්ථානය, ප්‍රචාරණය. (ii) නිෂ්පාදිතය, මිල, ස්ථානය, ප්‍රවර්ධනය.

(iii) නිෂ්පාදනය, මිල, ස්ථානය, ප්‍රචාරණය. (iv) නිෂ්පාදනය, මිල, ස්ථානය, ප්‍රවර්ධනය.

18 ඉදිරි නිශ්චිත කාලයකදී ව්‍යවසායකයා වෙළඳපොලට ඉදිරිපත් කිරීමට අපේක්ෂිත භාණ්ඩ හෝ සේවා ප්‍රමාණය තීරණය කිරීම,

(i) අලෙවිකරණයයි. (ii) විකුණුම් පුරෝකථනයයි.

(iii) ඉල්ලුම් පුරෝකථනයයි. (iv) විකුණුම් ප්‍රවර්ධනයයි.

- රසික දිනකට යෝගට් 30ක් නිෂ්පාදනය කරන අතර එකක් රු. 35 බැගින් අලෙවි කිරීමට අදහස් කරයි. ඉහත සිද්ධිය ඇසුරෙන් 19, 20 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

19 රසිකගේ ව්‍යාපාරයේ මාසික විකුණුම් ආදායම විය හැක්කේ ,

(i) රු. 930 (ii) රු. 1050 (iii) රු. 950 (iv) රු. 900

20 ඔහුගේ මාසික විකුණුම් ආදායම විය හැක්කේ,

(i) රු. 31, 500 (ii) රු. 10, 500 (iii) රු. 15, 000 (iv) රු. 15, 500

21 නිෂ්පාදන සැලැස්මක ඇතුලත් වන තොරතුරක් නොවන්නේ,

(i) නිෂ්පාදන ක්‍රියාවලිය (ii) ඒකකයක පිරිවැය

(iii) නිෂ්පාදන ස්ථාවර වත්කම් (iv) ආරම්භක වියදම්

22 යම් නිෂ්පාදිත ඒකක ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම සඳහා ද්‍රව්‍ය, ශ්‍රමය හා වෙනත් වියදම් වෙනුවෙන් දරණ ලද පිරිවැය වල එකතුව,

(i) ඒකක පිරිවැයයි. (ii) මුළු නිෂ්පාදන පිරිවැයයි.

(iii) පොදු කාර්ය පිරිවැයයි. (iv) ප්‍රාථමික පිරිවැයයි.

23 ව්‍යාපාර සැලැස්මක මූලිකාංගයක් නොවන්නේ,

(i) කර්මාන්ත සැලැස්ම (ii) අලෙවි සැලැස්ම

(iii) විධායක සාරාංශය (iv) පරිපාලන සැලැස්ම

24 ව්‍යාපාරයේ පිහිටීම, අලෙවි පුරෝකථනය, අලෙවි ප්‍රදේශ, වාර්ෂික අමුද්‍රව්‍ය අවශ්‍යතාවය යන කරුණු පිළිබඳව තොරතුරු සාරාංශගතව ඉදිරිපත් කරනු ලබන්නේ,

(i) නිෂ්පාදන සැලැස්මෙහි ය. (ii) අලෙවි සැලැස්මෙහි ය.

(iii) මූල්‍ය සැලැස්මෙහි ය. (iv) විධායක සාරාංශයෙහි ය.

25 ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාමේදී විවිධ වියදම් දැරීමට සිදුවේ. පහත සඳහන් කරුණු අතරින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර දැරීමට සිදුවන වියදමක් වන්නේ,

(i) තොග ලබාගැනීමේ වියදම. (ii) වැටුප් හා වේතන සඳහා වියදම.

(iii) බැංකු ණය වාරික හා පොළී ගෙවීම. (iv) වෙළඳපොළ සමීක්ෂණය සඳහා යන වියදම.

26 කළු ගල් කැඩීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී විශේෂ බලපත්‍රයක් ලබාගත යුතු ආයතනයකි.

(i) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව (ii) කාර්මික සංවර්ධන මණ්ඩලය

(iii) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (iv) අපනයන සංවර්ධන මණ්ඩලය

27 ව්‍යාපාර ආයතනයක් විසින් සකස් කරනු ලබන අරමුදල් ප්‍රවාහ ප්‍රකාශයක මුදල් ගලා ඒම් ලෙස සැලකිය හැක්කේ,

(i) වෙළඳ තොග ගැනීම (ii) පොත් රාක්ක සැකසීම

(iii) ණයගැතියන්ගෙන් ලැබීම් (iv) සේවක වැටුප්

28 ව්‍යාපාර කෙරෙහි උනන්දුව දක්වන පාර්ශවයක් වශයෙන් පාරිභෝගිකයන් ව්‍යාපාරයෙන් අපේක්ෂා කරනු ලබන්නේ,

(i) යෙදූ ප්‍රාග්ධනයට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලැබීම.

(ii) සාධාරණ මිලකට ගුණාත්මක භාණ්ඩ ලබා ගැනීම.

(iii) නීතිරීති වලට අනුකූල වීම.

(iv) සාධාරණ ආදායමක් ලැබීම.

29 ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී දෛනිකව දැරීමට සිදුවන වියදමක් වන්නේ,

(i) ස්ථාවර වත්කම් මිලට ගැනීම. (ii) ලියාපදිංචි ගාස්තු.

(iii) ව්‍යාපාර සැලසුම් සකස් කිරීමේ වියදම්. (iv) සේවක වැටුප් සඳහා යන වියදම්.

30 ව්‍යාපාර අදහස් ගණනාවක් අතරින් යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන පියවරක් නොවන්නේ,

(i) සූක්ෂම විශ්ලේෂණය (ii) සාර්ව විශ්ලේෂණය

(iii) ශදුඅත විශ්ලේෂණය (iv) අභ්‍යන්තර විශ්ලේෂනය

31 කේවලස්වාමි ව්‍යාපාරයක පමණක් දැකිය හැකි වාසියක් වන්නේ,
(i) ස්වාධීණව තීරණ ගතහැකි වීම (ii) පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
(iii) ලියාපදිංචිය අනිවාර්ය නොවීම (iv) බලපාන නීති රීති අල්ප වීම

32 ව්‍යාපාර සංවිධානයක පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණයක් නොවන්නේ,
(i) පොදු අරමුණක් පැවතීම (ii) නිශ්චිත ස්ථානයක් පැවතීම
(iii) සාමූහික සම්බන්ධතාවක් පැවතීම (iv) ආර්ථික කටයුත්තක නියැලීම

33 රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයකි.
(i) සංස්ථාපිත සමාගම් (ii) හවුල් ව්‍යාපාර
(iii) කේවලස්වාමි ව්‍යාපාර (iv) සංස්ථා

34 කේවලස්වාමී ව්‍යාපාරයක් ලියාපදිංචි කරන්නේ නම් ඒ කුමන පනත යටතේ ද?
(i) 1918 අංක 6 දරන ව්‍යාපාර නාම ආඥාපනත.
(ii) 2007 අංක 7 දරන සමාගම් පනත.
(iii) 1890 හවුල් ආඥා පනත.
(iv) 1840 අංක 07 දරණ වංචා වැලැක්වීමේ ආඥා පනත.

35 වරලත් ව්‍යාපාර හා සම්බන්ධ ප්‍රධාන පාර්ශව ගණන,
(i) 3 කි. (ii) 2 කි. (iii) 4 කි. (iv) 6 කි.

● 36, 37 ප්‍රශ්න වලට පහත තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.
ප්‍රභාෂ්වරගේ ව්‍යාපාරයේ නිෂ්පාදන වියදම් පිළිබඳ ඇස්තමේන්තුව පහත දැක්වේ. මෙම ව්‍යාපාරය මසකට සිමෙන්ති මල්පෝච්චි 1000ක් නිෂ්පාදනය කරයි. මාසික වියදම් ඇස්තමේන්තුව;
1ක් රු. 1,000 බැගින් සිමෙන්ති මළු 30 යි.
1ක් රු.6,000 බැගින් වැලි කියුබ් 1 යි.
ජලය රු. 500 යි.
ශ්‍රමිකයන්ගේ මාසික වැටුප රු. 10 000 යි.

36 මල්පෝච්චි 1000 නිපදවීම සඳහා වැයවන මුළු පිරිවැය කොපමණ ද?
(i) රු. 46 000 (ii) රු. 36 000 (iii) රු. 46 500 (iv) රු. 40 000

37 මල්පෝච්චියක් නිපදවීම සඳහා වැයවන මුදල කොපමණ ද?
(i) රු. 46 ශත 75 (ii) රු. 46 ශත 50 (iii) රු. 40 ශත 50 (iv) රු. 36 ශත 50

38 කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සපයනු ලබන සේවාවකි.
(i) විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව. (ii) භාණ්ඩ සඳහා තත්ත්ව සහතික නිකුත් කිරීම.
(iii) අලෙවිකරණ සේවා සැපයීම. (iv) ආනයන පරීක්ෂාව.

39 ව්‍යාපාරයකට සමාජ වගකීම් ඉටුකළ හැකි ආකාරයකි.
(i) ජාතික වගකීම් ලෙස (ii) පුද්ගල වගකීම් ලෙස
(iii) සදාචාරාත්මක වගකීම් ලෙස (iv) රාජ්‍ය වගකීම් ලෙස

40 කාන්තා ව්‍යවසායකත්වයට ඇති බාධාවක් නොවන්නේ,
(i) ප්‍රාග්ධනය සපයා ගැනීමේ දුෂ්කරතාව.
(ii) ප්‍රවර්ධන වැඩසටහන් ප්‍රමාණවත් නොවීම.
(iii) කාන්තාවගේ ස්වාධීනත්වය සමාජය තුළ ස්ථාපිත නොවීම.
(iv) පිරිමැසුම් සහිත බව.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** | **63 - ව්‍යවසායකත්ව අධ්‍යයනය II** (නව නිර්දේශය) | **කාලය පැය 2 යි**

නම/ විභාග අංකයː

- **පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 කුත් සෙසු ඒවාට ලකුණු 10 කුත් බැගින් හිමිවේ.**

---

01. ස්වාධීනත්වය අගය කළ ප්‍රියන්ත මහතා තමන්ගේම කියා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කලේය. ආරම්භ කිරීමට යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීම සඳහා ඔහුගේ සිත තුල පහළ වූ ව්‍යාපාර අදහස් ඇගයිමට භාජනය කලේය. වර්තමානයේ රාජ්‍ය ප්‍රතිපත්තියක් ව පවතින කාබනික පොහොර භාවිතය යෝග්‍ය ව්‍යාපාර අවස්ථාව ලෙස තෝරා ගත් ප්‍රියන්ත මහතා අපතේ යන ද්‍රව්‍ය භාවිතා කරමින් ක්ෂණික ප්‍රතිඵල ගෙන දෙන දියර කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කලේය.

වෙනස් වන පරිසරයට අනුගත වීමට කැමති, අවදානම් බාරගැනීමට මැලි නොවූ නිර්මාණශීලී පුද්ගලයෙක් වූ ප්‍රියන්ත මහතා රු. 300,000 වටිනා සිය ඉඩම ද, රු. 200,000 වටිනා ගොඩනැගිල්ල ද, රු. 20,000 වටිනා ප්ලාස්ටික් ටැංකිය ද, රු. 50,000 වටිනා උපකරණ ද , ව්‍යාපාරය සඳහා යෙදවීමට තීරණය කලේය.

මීට අමතරව වෙළඳපොල සමීක්ෂණය සඳහා රු. 5,000ක් ද, ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා රු. 1,500 ක් ද, ව්‍යාපාර සැලැස්ම සැකසීම සඳහා රු. 8,000ක් ද, ව්‍යාපාර ආරම්භ කිරීමේ සමාරම්භක උත්සවය සඳහා රු. 4,000ක් ද, දෛනික මුදල් අවශ්‍යතා සඳහා රු. 30,000ක් ලඟ තබා ගැනීමට ද, තීරණය කර ඇත.

ප්‍රියන්ත මහතාගේ සිද්ධිය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) සිද්ධිය තුල ඇතුලත් නවෝත්පාදනය සිදුවන ආකාරය සඳහන් කරන්න.

(ii) ප්‍රියන්ත මහතා විසින් හඳුන්වා දීමට අපේක්ෂිත නිෂ්පාදිතය සඳහන් කරන්න.

(iii) සිද්ධියෙන් ප්‍රකාශවන ප්‍රියන්ත මහතා ළඟ ඇති ව්‍යවසායකත්ව ගති ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(iv) ප්‍රියන්ත මහතාගේ ව්‍යාපාරය සඳහා දැක්මක් ගොඩනගන්න.

(v) හොඳ ව්‍යාපාර අදහසක් (ව්‍යාපාර අවස්ථාවක්) තෝරා ගැනිම සඳහා ප්‍රියන්ත මහතා අනුගමනය කල යුතු පියවර දෙකක් සඳහන් කරන්න.

(vi) මෙම ව්‍යාපාරයෙන් දේශීය ආර්ථිකයට අත්විය හැකි ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

(vii) ප්‍රියන්ත මහතා ස්ථාවර වත්කම්වල ආයෝජනය කිරීමට අපේක්ෂිත මුදල කොපමණ ද?

(viii) ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර දැරීමට අපේක්ෂිත මුදල කොපමණ ද?

(ix) මොහුගේ ව්‍යාපාරය සඳහා අවශ්‍ය වන මුළු කාරක ප්‍රාග්ධනය ගණනය කර දක්වන්න.

(x) ප්‍රියන්ත මහතා ව්‍යාපාරය සඳහා ආයෝජනය කිරීමට අපෙක්ෂිත මුළු මුදල කොපමණ ද? (ල. 20)

02 (1) ව්‍යවසායකත්වය යනු කුමක්දැයි ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

(2) අවදානම හා ප්‍රතිලාභ අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(3) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමට අවශ්‍ය වන නිෂ්පාදන සාධක 4 නම් කරන්න.

(4) අවශ්‍යතා හා වුවමනා අතර ඇති වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

(5) ව්‍යවසායකත්ව කාර්යයේ නිරත ව්‍යාපාරිකයෙකුට හිමිවන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.(ල. 10)

03 (i) කුඩා පරිමාණ ව්‍යාපාරයක් යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
(ii) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර ඇති වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.
(iii) කුඩා ව්‍යාපාරවල දැකිය හැකි ශක්තීන් දෙකක් සඳහන් කරන්න.
(iv) ව්‍යවසායකයකු විසින් වර්ධනය කර ගත යුතු මූලික කුසලතා දෙකක් සඳහන් කරන්න.
(v) ව්‍යාපාර පරිසරයේ ඇති නව ප්‍රවණතා දෙකක් සඳහන් කරන්න. (ල. 10)

04 (i) නව ව්‍යවසායකයකුට වෙළඳපොලට පිවිසිය හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න.
(ii) ව්‍යාපාර අදහසක් යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
(iii) ව්‍යවසායකයෙකුට ව්‍යාපාර අදහස් පහළ විය හැකි මූලාශ්‍ර හතරක් සඳහන් කරන්න.
(iv) ''ශඳුඅත විශ්ලේෂණයේ අයිතම හතර සඳහන් කරන්න.
(v) ව්‍යාපාර අහසක් හා ව්‍යාපාර අවස්ථාවක් අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ල. 10)

05 (i) ඉලක්කගත පාරිභෝගිකයා යනු කවරෙක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
(ii) ව්‍යාපාර සැලැස්මක සංයුතියේ ඇතුලත් මූලිකාංග හතරක් සඳහන් කරන්න.
(iii) ව්‍යාපාරයකට ව්‍යාපාර සැලැස්මක් වැදගත් වන අවස්ථා දෙකක් සඳහන් කරන්න.
(iv) අලෙවි සැලැස්මක අන්තර්ගත කොටස් දෙකක් සඳහන් කරන්න.
(v) යෝජිත ව්‍යාපාරයක අලෙවිකරණ උපාය මාර්ග (4P) නම් කරන්න.

06 (i) ඇඟලුම් කර්මාන්ත ශාලාවක නිෂ්පාදන අංශය සඳහා අවශ්‍ය වන තනතුරු දෙකක් සඳහන් කරන්න.
(ii) ව්‍යාපාර ආයතනයක පරිපාලන ඇස්තමේන්තුවක ඇතුලත් කළ හැකි අනෙකුත් පරිපාලන වියදම් වර්ග 4ක් සඳහන් කරන්න.
(iii) ව්‍යාපාර සංවිධානයක පොදුවේ දැකිය හැකි ලක්ෂණ හතරක් නම් කරන්න.
(iv) ව්‍යාපාරයක් සමාජ වගකීම් ඉටුකිරීමෙන් ව්‍යාපාරයට අත්වන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.
(v) ව්‍යාපාර ආයතනයක පවතින අලෙවි ස්ථාවර වත්කම් යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

07 පාසල් උපකරණ අලෙවිසැලක් ආරම්භ කිරීමට අපේක්ෂිත ප්‍රභාෂ්වරගේ ව්‍යාපාරයේ 2017 වර්ෂය සඳහා සකසන ලද ව්‍යාපාර සැලැස්මෙන් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| ව්‍යාපාරය සඳහා යෙදවූ මුදල | රු. 200,000 |
| අපේක්ෂිත අලෙවි ආදායම | රු. 350, 000 |
| බැංකු ණය ගැනීම | රු. 50, 000 |
| විදුලි බිල සඳහා | රු. 12, 000 |
| ණයගැති ලැබීම් | රු. 18, 000 |
| සේවක වැටුප් ගෙවීම් | රු. 150, 000 |
| මෙහෙයුම් පෙර වියදම් | රු. 10, 000 |
| ණය වාරික හා පොළිය ගෙවීමට | රු. 25, 000 |
| ණය හිමියන්ට ගෙවීම් | රු. 30, 000 |
| පොත් රාක්ක සැකසීමට | රු. 35, 000 |
| බඩු තොග ලබා ගැනීමට | රු. 100, 000 |
| දුරකථන බිල් ගෙවීමට | රු. 12, 000 |
| කඩ කුලිය ගෙවීමට | රු. 15, 000 |
| කාර්යාලීය උපකරණ ගැනීමට | රු. 40,000 |
| වීදුරු අල්මාරියක් ගැනීමට | රු. 25,000 |
| ජල බිල් ගෙවීමට | රු. 2,000 |

ඉහත සඳහන් තොරතුරු ඇසුරින් ප්‍රභාෂ්වරගේ ව්‍යාපාරයේ 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරන්න.

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (iii) | 02. ( i ) | 03. (iii) | 04. (ii ) | 05. (iv) | 06. ( i ) | 07. (iii) | 08. (ii ) | 09. (iii) | 10. ( i ) |
| 11. (ii ) | 12. (iv) | 13. ( ii) | 14. (iii) | 15. (iii) | 16. ( i ) | 17. (ii ) | 18. (ii ) | 19. (iv) | 20. ( i ) |
| 21. (iv) | 22. (ii ) | 23. ( i) | 24. (iv) | 25. (iv) | 26. ( i ) | 27. (iii) | 28. (ii ) | 29. (iv) | 30. (iv) |
| 31. (i ) | 32. (ii ) | 33. (iv) | 34. ( i ) | 35. (ii ) | 36. (iii) | 37. (ii ) | 38. (iii) | 39. (iii) | 40. (iv) |

(ලකුණු 40 යි.)

## II පත්‍රය

01. (i) දිගුවක් (ල. 02) (ii) දියර කාබනික පොහොර (ල. 02)

(iii) නවෝත්පාදනය, නිර්මාණශීලීත්වය, අවදානම් භාරගැනීම, අවස්ථා හඳුනාගැනීම, ස්නාධීනත්වය, සුභවාදී වීම, නම්‍යශීලීත්වය (කරුණු 2කට ලකුණු 2)

(iv) ගැලපෙන පිළිතුරකට ලකුණු දෙන්න. (ල. 02)

(v) සාර්ව විශ්ලේෂණය/ සූක්ෂම විශ්ලේෂණය/ ශුද්‍රඅත විශ්ලේෂණය (ල. 02)

(vi) අපතේ යන සම්පත් නිෂ්පාදන කාර්යයට යෙදවීම/ රැකියා අවස්ථා සැපයීම/ නව භාණ්ඩ වෙළඳපොලට පැමිණීම/ අදාලවන වෙනත් පිළිතුරු (කරුණු 02 කට ලකුණු 02)

(vii) රු. 570000/= (viii)රු. 18500/= (ix) රු. 30000/= (x) රු. 618000/=

02 (i) අදාල පිළිතුරකට ලකුණු දෙන්න. (ල. 02)

(ii) අවදානම ඉහළ නම් ප්‍රතිලාභ ද ඉහළ වේ.අවදානම පහළ නම් ප්‍රතිලාභ ද පහළ වේ.

(iii) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසයකත්වය, (කරුණු 4 කට ලකුණු 02)

(iv)

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| මූලිකව පැණ නගියි | අවශ්‍යතා ඇති වූ පසු පැණනගියි |
| සීමිතය | අසීමිතය |
| සියලුදෙනාටම පොදුය | විවිධ වේ. |
| උප්පත්තියත් සමග ඇතිවේ | ව්‍යාපාරිකයින් නිර්මාණය කරයි. |

(v) ස්වකීය දෛවය තමා මතම රඳා පැවතීම/ කාර්යයන්හි විවිධත්වයක් ඇති වීම/ සමාජ සුභසාධනය සඳහා දායක විය හැකි වීම/ ප්‍රයෝජනයට නොගත් හැකියා යොදා ගත හැකි වීම/ ආකර්ශනීය ලාභයක් ඉපයීම/ ස්වයංපෝශිත බව/ වර්ධනය සඳහා පුද්ගලයන්ට ලැබෙන්නා වූ උපරිම අවකාශය/ නිදහස හා ඉතා ඉහළ තෘප්තියට පත් වීම (ල. 02)

03 (i) පෞද්ගලික හිමිකාරත්වය යටතේ ස්වාධීනව මෙහෙයවනු ලබන සාපේක්ෂව කුඩා සේවක සංඛ්‍යාවක් සහ අඩු ආයෝජනයක් සහිත ව්‍යාපාර කුඩා පරිමාණ ව්‍යාපාර ලෙස හැඳින්වේ. අදහස පැහැදිලි වන පිළිතුරකට ලකුණු පිරිනමන්න. (ල. 02)

(ii) <u>ව්‍යාපාරිකයා</u>

ගතානුගතික ක්‍රමවලට ව්‍යාපාර කටයුතු සිදු කරයි.
අවදානම් භාර ගැනීමට කැමැත්තක් නොදක්වයි.
තරගයට මුහුණ දීමට කැමැත්තක් නොදක්වයි.
පවතින සම්පත්වලින් පවා උපරිම ප්‍රයෝජන නොගනී.
ගතානුගතික ක්‍රම වලට ගැටළු විසඳයි.
ඉතා ආසන්න ඉලක්ක ඇතිකර ගනියි.
ව්‍යාපාරය පවත්නා තත්වයෙන් ම පවත්වාගැනීමෙන් සෑහීමකට පත් වේ

<u>ව්‍යවසායකයා</u>

පරිසර වෙනස්වීම් ඔස්සේ නිර්මාණශීලීත්වය නවෝත්පාදන කරගෙන ව්‍යාපාර කටයුතු කරයි.
තක්සේරුකර දැරිය හැකි අවදානම් පමණක් භාරගනී
තරගය කැමැත්තෙන් සොයා යයි.
උපරිම ඵල ප්‍රයෝජන ලබා ගනියි.
නිර්මාණශීලීව ගැටළු විසඳයි
අනාගත දැක්මක් සහිතව දූරදර්ශීව ඉලක්ක පිහිටුවා ගනියි.
ව්‍යාපාරය දිනෙන් දින පුළුල් කර ගනියි. පවතින තත්ත්වය ගැන සෑහීමකට පත් නොවේ. (ල. 02)

The National e-Learning Portal for The General Education

(iii) සීමිත සම්පත් ප්‍රමාණයකින් වුවත් ආරම්භ කළ හැකි වීම/ පවත්නා දේශීය තාක්ෂණය වුවද භාවිතයට ගත හැකි වීම/ පරිසර වෙනස්වීම් වලට පහසුවෙන් අනුගත විය හැකි වීම/ විශේෂ දිරිගැන්වීම් රජයෙන් ලැබීම . සේවකයින් බඳවාගැනීම සහ පුහුණුව පහසු වීම/ සේවකයින්ගේ කුසලතාවලින් ප්‍රයෝජන ගත හැකි වීම/ සේවකයින් වැඩි වරප්‍රසාද අපේක්ෂා නොකිරීම/ පවුලේ සහය ව්‍යාපාර කටයුතු වලට යොදාගත හැකි වීම/ ගතික පරිසරයට ප්‍රතිචාර දැක්විය හැකි වීම (කරුණු දෙකකට ලකුණු 02)

(iv) තාක්ෂණික කුසලතා/ මානව කුසලතා/ සංකල්පනාත්මක කුසලතා/ සන්නිවේදන කුසලතා/ උපදේශන කුසලතා/ ආදර්ශවත්ව කටයුතු කිරීමේ කුසලතාව/ කණ්ඩායම් සමග කටයුතු කිරීමේ කුසලතා (කරුණු 02 කට ලකුණු 02)

(v) නව තාක්ෂණික ක්‍රම භාවිතය/ පරිසර හිතකාමී නිෂ්පාදන සඳහා යොමුවීම/ සැකසූ ආහාර සඳහා ඉල්ලුම ඉහළ යාම (කරුණු දෙකකට ලකුණු 02)

04 (i) පවතින භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳ පනතට ඉදිරිපත් කිරීම/ පවත්නා භාණ්ඩයක් හෝ සේවාවක් තම වෙළඳපොලට ඉදිරිපත් කිරීම/ නව භාණ්ඩයක් හෝ සේවාවක් පවත්නා වෙළඳපලට ඉදිරිපත් කිරීම/ නව භාණ්ඩ හෝ සේවාවක් නව වෙළඳපලට ඉදිරිපත් කිරීම (කරුණු 2 කට ලකුණු 2යි.)

(ii) පරිසරයේ ඇති ගැටළුවකට විසඳුමක් ලෙස පුද්ගල අවශ්‍යතා හා වුවමනා සපුරාලන වාණිජමය වටිනාකමක් ඇති සිතුවිල්ලකි. (ල. 02)

(iii) විනෝදාංශ හා ලැදියා තුළින්/ පුද්ගල දක්ෂතා හා පළපුරුද්ද තුළින්/ වෙළඳපොළ සමීක්ෂණය තුළින්/පාරිභෝගික ප්‍රතිචාර තුළින්/ නිර්මාණශීලී චින්තන හැකියා තුළින්/ ජනමාධ්‍ය මගින්/ සැපයුම්කරුවන් ඇසුරින්/ තරගකාරීත්වය අධ්‍යයනය තුළින්/ අධ්‍යාපනික පාඨමාලා තුළින්/ප්‍රදර්ශන හා අත්දැකීම් තුළින් (ල. 02)

(iv) ශක්තීන්/ අවස්ථා/ දුර්වලතා/ තර්ජන

(v)

| ව්‍යාපාර අදහස | ව්‍යාපාර අවස්ථාව | |
|---|---|---|
| ව්‍යාපාර අදහස් සුලභ වීම | අදහස් අතරින් අවස්ථා කීපයක් තෝරාගත හැකි වීම | |
| ව්‍යාපාර අදහස් විවෘත්ත වීම | ව්‍යාපාර අවස්ථා අනාවරණය කර ගැනිම අපහසුය. | |
| සෑම අදහසක්ම ප්‍රායෝගික නොවේ. | ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකිය. | (ල. 02) |

05 (i) නව නිෂ්පාදිතය මිලදී ගණු ඇතැයි අපේක්ෂා කරන හෝ අනාගතයේ මිල දී ගැනීමට පොළඹවා ගැනීමට හැකි වේ යැයි අපේක්ෂා කරන පාරිභෝගික පිරිස ඉලක්කගත පාරිභෝගිකයන් ලෙස හැඳින්වේ. (ල. 02)

(ii) විධායක සාරාංශය/ නිෂ්පාදන සැලැස්ම/ මූල්‍ය සැලැස්ම/ අලෙවි සැලැස්ම/ පරිපාලන සැලැස්ම

(iii) ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ව්‍යාපාර අදහස පැහැදිලි කිරීමට/ ව්‍යාපාරය ඉදිරියට කරගෙන යාමට අවශ්‍ය මග පෙන්වීම් කිරීමට/ ව්‍යාපාරය අනාගතයේ ගමන් කිරීමට බලාපොරොත්තු වන දිශාව පෙන්වීමට/ අවශ්‍ය මුදල් සම්පාදනය කර ගැනීමට (ල. 02)

(iv) වෙළඳපොල විශ්ලේෂණය/ යෝජිත ව්‍යාපාරයේ අලෙවිකරණ උපාය මාර්ග/ විකුණුම් පුරෝකථනය/ අලෙවි ආදායම් හා වියදම්/ අලෙවි ස්ථාවර වත්කම් (ල. 02)

(v) නිෂ්පාදිතය/ මිල/ ස්ථානය/ ප්‍රවර්ධනය (ල. 02)

06 (i) වැඩ අධීක්ෂකවරු/ මැෂින් ක්‍රියාකාරු/ අත් උදවුකරු/ නිෂ්පාදන කළමනාකරු (ල. 02)

(ii) ගොඩනැගිලි කුලී/ ලිපිද්‍රව්‍ය වියදම්/ දුරකථන වියදම්/ වරිපනම් බදු/ ස්ථාවර වත්කම්/ ක්ෂය හෝ නඩත්තු වියදම් (ල. 02)

(iii) පොදු අරමුණක් තිබීම/ සීමිත සම්පත් භාවිතය/ සාමූහික සම්බන්ධතාවයන් පැවතීම/ ආර්ථික කටයුත්තක නියැලීම/ පුද්ගල කණ්ඩායමක් ඒකරාශී වී සිටීම (ල. 02)

(iv) ව්‍යාපාරයේ කීර්තිනාමය වර්ධනය වීම/ දිගු කාලීන පැවැත්ම ස්ථාපිත වීම/ පැන නැගිය හැකි නීතිමය ප්‍රශ්න අවම වීම/ ලාභය ඉහළ යාම/ සේවකයින්ගේ ව්‍යාපාරය කෙරෙහි ඇති ලැදියාව වැඩිවීම (ල. 02)

(v) ව්‍යාපාරයක අලෙවිය හා බෙදාහැරීමේ කටයුත සඳහා යොදාගනු ලබන යන්ත්‍ර උපකරණ, ගොඩනැගිලි වැනි ඍජුවම දායක කරගන්නා සම්පත් ය. (ල. 02)

07 ප්‍රභාෂ්වරගේ ව්‍යාපාරයේ 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය (½)

| විස්තරය | රුපියල් | රුපියල් |
|---|---|---|
| <u>මුදල් ගලා ඒම්</u> | | |
| ප්‍රාග්ධනය(යෙදවූ මුදල) | 200,000 (½) | |
| අලෙවි ආදායම | 350,000 (½) | |
| බැංකු ණය ගැනීම | 50,000 (½) | |
| ණයගැති ලැබීම් | 18,000 (½) | |
| මුළු මුදල් ගලා ඒම් | | 618,000 (½) |
| <u>මුදල් ගලා යාම්</u> | | |
| විදුලි බිල | 12,000 (½) | |
| සේවක වැටුප් | 150,000 (½) | |
| මෙහෙයුම් පෙර වියදම් | 10,000 (½) | |
| ණය වාරික හා පොලී | 25,000 (½) | |
| ණයහිමියන්ට ගෙවීම | 30,000 (½) | |
| පොත් රාක්ක සැකසීම | 35,000 (½) | |
| බඩු තොග ගැනීම | 100,000 (½) | |
| දුරකථන බිල් | 12,000 (½) | |
| කඩ කුලිය | 15,000 (½) | |
| කාර්යාල උපකරණ ගැනීම | 40,000 (½) | |
| වීදුරු අල්මාරියක් ගැනීම | 25,000 (½) | |
| ජල බිල් ගෙවීම | 2,000 (½) | |
| මුළු මුදල් ගලා යාම | | 456,000 (½) |
| කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය | | 162,000 (½) |

(ල. 10)

The National e-Learning Portal for The General Education